තමාට අදාළ නොවන දේ අත්හැරීම " පුද්ගලයෙකුගේ ඉස්ලාම්හි පවතින යහපත් කරුණු අතුරින් එකකි

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. "තමාට අදාළ නොවන දේ අත්හැරීම " පුද්ගලයෙකුගේ ඉස්ලාම්හි පවතින යහපත් කරුණු අතුරින් එකකි.
[قال النووي: حديث حسن] [رواه الترمذي وغيره]

මුස්ලිම්වරයෙකුගේ ඉස්ලාමයේ පරිපූර්ණත්වයේ සහ ඔහුගේ විශ්වාසයේ සම්පූර්ණත්වයේ කොටසක් වන්නේ ඔහුට අවශ්ය නොවන ඔහුට අදාළ නොවන, ඔහුට වැදගත් නොවන දෑ අත්හැරීම, වචන හා ක්රියාවන් අතින් ඔහුට ප්රයෝජනවත් නොවන දැයින් හෝ ආගමික හෝ ලෞකික කාරණා අතින් ඔහුට අදාළ නොවන දැයින් වැළකී සිටීම බව නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කළහ. පුද්ගලයෙකුට අදාළ නොවන දෑ වෙත සිත යොමු කිරීමෙන්, ඔහුට අදාළ දේවලින් ඔහු අවධානය වෙනතකට යොමු කළ හැකිය. නැතහොත් ඔහු වැළකී සිටිය යුතු දේට ඔහුව යොමු කළ හැකිය. නැවත නැගිටුවනු ලබන දිනයේදී පුද්ගලයෙකු තම ක්රියාවන් සඳහා වගකිව යුතුය.

http://www.sunnah.global/hadeeth/si/show/65255